# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කෑගල්ල

## වායු රයිෆල් මිළදී ගැනීම සඳහා ලංසු කැඳවීම

කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් පහත සඳහන් ප්‍රසම්පාදන කාර්යයන් සඳහා මිළ ගණන් කැඳවනු ලැබේ.

| අයිතමය | අවශ්‍ය ප්‍රමාණය | ප්‍රසම්පාදන අංකය | ආපසු නොගෙවන ලංසු ලියවිලි ගාස්තුව (රු.) | ලංසු බැඳුම්කර වටිනාකම (රු.) | ලංසු බැඳුම්කර වලංගු කාලය | ලංසු කැඳවීම අවසන් දිනය හා වේලාව |
|---|---|---|---|---|---|---|
| වායු රයිෆල් | 344 | DSK/ACC/CON/ PRAIR/A13/06 | 3,500.00 | 172,000.00 | 2026.05.12 සිට 2026.08.25 | 2026.05.12. පෙ:ව 10.30 |

01. මේ සඳහා වන පිරිවිතර ඇතුළත් ලංසු ලේඛන ආපසු නොගෙවන ලංසු ලියවිලි ගාස්තු රු.3,500/= කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ගෙවා ලබා ගත් රිසිට්පත ගිණුම් අංශය වෙත ඉදිරිපත් කර 2026.04.29 සිට 2026.05.11 දක්වා රජයේ වැඩ කරන දිනවල පෙ:ව: 09.00 සිට ප:ව: 2.30 දක්වා කාලය තුළ ලබා ගත හැකිය.
02. සම්පූර්ණ කරන ලද ලංසු ලේඛන 2026.05.12 දින පෙ:ව: 10.30 ට පෙර ‘‘ සභාපති,ප්‍රසම්පාදන කමිටුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල’’ යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමට හෝ අතින් ගෙනවිත් ගිණුම් අංශයේ තබා ඇති ප්‍රසම්පාදන බහාලනයට බහාලිය හැකිය. මිළ ගණන් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ “වායු රයිෆල් මිළදී ගැනීම” ලෙස සඳහන් කළ යුතුය.සෑම ටෙන්ඩරයක් සඳහාම මුල් පිටපත හා අනු පිටපත වශයෙන් කවර දෙකක් සකස් කර ඒ බව කවර වලද සඳහන් කර පිටපත් දෙකම එකම කවරයක බහා මුද්‍රා තබා ඉදිරිපත් කළ යුතුය.
03. මිළ ගණන් විවෘත කිරීමේ කාර්යය 2026.05.12 දින පෙ:ව:10.30 ට සිදු කරනු ලබන අතර, ඒ සඳහා ඔබට හෝ ඔබ ආයතනයේ නියෝජිතයෙකුට අනන්‍යතාවය සහතික කර සහභාගී විය හැකිය.
04. ලංසු සුරක්ෂණය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමත ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ වාණිජ බැංකුවකින් දිස්ත්‍රික් ලේකම්, කෑගල්ල නමින් ලබා ගත් වලංගු ඇපකරයක් හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සරප් වෙත මුදලින් ගෙවා ලබා ගත් රිසිට්පතෙහි මුල් පිටපත දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,කෑගල්ල නමින් ඉදිරිපත් කළ යුතුය.
05. ලංසු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වන තොරතුරු ලංසු ලේඛනයේ ඇතුළත් කර ඇති අතර මේ සඳහා වැඩිදුර තොරතුරු 035-2223112 දුරකථන අංකය මගින් ප්‍රධාන ගණකාධිකාරි අමතා ලබාගත හැකි බව වැඩිදුරටත් දන්වමි.ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය වේ.

**සැ:යු මිල ගණන් ඉදිරිපත් කරන විට ප්‍රමාණවත් තොග මට්ටම් තිබිය යුතු අතර ඔබ ආයතනය මෙම මිලදී ගැනීම සඳහා තේරිපත් වුවහොත් ඇණවුම ලබාදී දින 60 ක් ඇතුලත භාණ්ඩ සැපයිය යුතුය.**

**දිස්ත්‍රික් ලේකම්(රා: ආ) /ප්‍රසම්පාදන කමිටු සභාපති,**
**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,**
**කෑගල්ල.**